**දකුණු ආසියා උප කලාපීය ආර්ථික සහයෝගිතාවයෙන් කණු මතින් දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය යටතේ වැඩපල ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීම් ව්‍යාපෘතිය - 2022**

---

දකුණු ආසියා උප කලාපීය ආර්ථික සහයෝගිතාවයෙන් කණු මතින් දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය යටතේ වැඩපල ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීම් ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3716-එස්ආර්අයි(එස්එෆ්) දරන ණය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම සහ ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කණුමතින් දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දැනට පවතින වැඩපල ගොඩනැගිල්ල වෙනත් ස්ථානයකට ගෙන යාමට අවශ්‍ය වීම සහ ණය ගිවිසුමේ ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, ජාතික වරාය ප්‍රධාන සැලැස්මට අනුව වරාය පහසුකම් සංවර්ධනය සඳහා සූදානම් වීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට සහාය වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. වැඩපල ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීම යන සිවිල් කටයුතු සංරචකය යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,090.08 කට සමාන එ.ජ.ඩො. මිලියන 6.11 ක් වන අතර ඉන් රු.මිලියන 1,090.08 කට සමාන එ.ජ.ඩො. මිලියන 6.11 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2021 සැප්තැම්බර් 09 දින ආරම්භ කර ඇති අතර 2022 ජූනි 09 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2023 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදි. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2.1 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන සංග්‍රහයේ 2.4 සහ 2.6 උප වගන්ති | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉංජිනේරු ඇස්තමේන්තු, ලංසු ලේඛන සහ ප්‍රමාණ පත්‍රය ඇගයීමට ලක් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉංජිනේරු | 2021 වර්ෂයේ මැද භාගයේදී ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයට අනුව, ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීම අධෛර්යමත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩවල මිල ක්‍රමයෙන් වැඩි විය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුවල පැවති පරස්පරතා සහ වැරදි අර්ථකථනය හේතුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන අවස්ථාවේදී රු. මිලියන 185.18ක පාඩුවක් දැරීමට සිදුවී තිබුණි. තවද, මිල විචලනයන් සඳහා ද රු. මිලියන 132.96ක මුදලක් ද ගෙවා තිබුණි. | | |
| (ආ) | කොන්ත්‍රාත් කොන්දේසියේ 4.10 උප වගන්තිය | කොන්ත්‍රාත්තුවේ 4.10 කොන්දේසියට අනුව, සේවා යෝජකයා විසින් බොරෝහෝල් විමර්ශන වාර්තා (Borehole Investigation Reports) සැපයිය යුතු අතර කොන්ත්‍රාත්කරු විසින් ඒවායේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට සාධාරණ උත්සාහයන් ගතයුතු අතර කොන්ත්‍රාත්කරු විසින් වැඩිදුර විමර්ශන සිදු කළ යුතුය. කෙසේවෙතත්, ඉහත වගන්තියට පටහැනිව, තාවකාලික මුදල් අයිතමය යටතේ විශේෂ පරීක්ෂණයක් සඳහා කොන්ත්‍රාත්කරුට රු. 566,875 ක මුදලක් ගෙවා ඇත. | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනුදැනුමකින් තොරව කණුමතින් දිවෙන වරාය පිවිසුම් අධිවේගී මාර්ගයේ කොන්ත්‍රාත්කරු විසින් කණුමතින් දිවෙන වරාය පිවිසුම් අධිවේගී මාර්ගයේ ජාල මාර්ග වෙනස් කර ඇත. එමනිසා මුළු ගොඩනැගිල්ලම අලුත් මාවත පාරේ බැම්ම දෙසට ගෙන යාමට සිදු විය. | අමතර වියදම් වළක්වා ගැනීම සඳහා කාලෝචිත පියවර ගත යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත් විශේෂ කොන්දේසියේ 8.7 උප වගන්තිය | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසියේ 8.7 වගන්තියට අනුව, සේවායෝජකයා (ශ්‍රී ලංකා වරාය අධිකාරිය) කොන්ත්‍රාත්කරුගේ පිළිගත් කොන්ත්‍රාත්තු මුදලින් සියයට 10 කට නොවැඩි ප්‍රමාද හානි අය කළ යුතුය.<br>කෙසේවෙතත්, ව්‍යාපෘතිය මාස 09 (ඊඔටී 02) පමණ කාලයක් ප්‍රමාද වී තිබුණද ප්‍රමාද හානිය අය කර නොතිබුණි. | FIDIC හි 2.1 උප වගන්තියට අනුව, කණුමතින් දිවෙන අධිවේගී මාර්ගයේ කොන්ත්‍රාත්කරු ඔවුන්ගේ ඉදිකිරීම් කටයුතු සඳහා එම ප්‍රදේශයම භාවිත කරමින් සිටි බැවින් 2023 අප්‍රේල් 25 වන දින දක්වා ශ්‍රී ලංකා වරාය අධිකාරියට එම ඉඩමේ කොටසක අයිතිය ලබා දීමට නොහැකි විය. එබැවින්, කාලය දීර්ඝ කිරීම අවසන් වන තෙක් ප්‍රමාද හානි අය කිරීම අවශ්‍ය නොවේ. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය අත්කර ගත් කාර්යසාධනය ඒකක/ප්‍රතිශතය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| මාසික ප්‍රගති වාර්තා | කොන්ත්‍රාත්කරුවන් මුල් වැඩ නිම කිරීමේ දින සිට දින 205ක් ගත වුවද කිසිදු ප්‍රධාන කටයුත්තක් සම්පූර්ණ කිරීමට අපොහොසත් වී ඇත. | අයිතමය / ආකෘතියේ නම / ප්‍රගතිය %<br>1 / යන්ත්‍රපොළ / 91.45<br>2 / වානේ පින්තාරුපොළ / 38.20<br>3 / සවිකිරීම්බල පොළ / 67.51<br>4 / කම්මල්පොළ / 91.81<br>5 / රැඳවුම් බිත්තිය / 50<br>6 / සීර්බී උප පොළ / 74.35<br>7 / ගිනි ඒකකය / 4.25<br>8 / ට්‍රාන්ස්ෆෝමර් ස්ථාපනය / 13.5<br>9 / මලාපවහන ටැංකිය / 1.25 | 2022 ජුනි මාසය වන විට ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කර තිබුණද, (PAEH) කොන්ත්‍රාත්කරු විසින් ග්‍රිඩ් ලයින් වෙනස් කිරීම, ගොඩනැගිලි භූමිය හරහා දැනට පවතින පොල්තෙල් නල මාර්ගය එළිම, අත්‍යවශ්‍ය වානේ ද්‍රව්‍ය ආනයනය කිරීම එල්සී විවෘත කිරීමට රට තුළ ඩොලර් නොමැතිවීම, භාණ්ඩ හා සේවාවල අසාමාන්‍ය මිල ඉහළ යාම, කොවිඩ් - 19 වසංගත තත්ත්වයන්, අයහපත් කාලගුණික තත්ත්වය සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වැඩබිම භාරදීමේ ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘතිය නිමකිරීම ප්‍රමාද විය. | නියමිත කාල සීමාව තුළ භෞතික ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු අතර ප්‍රමාදයන් සඳහා කිසියම් වලංගු හේතුවක් තිබේ නම්, එය අදාළ බලධාරීන්ගේ අනුමැතිය සහිතව ලේඛනගත කළ යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියමිත කාලසීමාව තුළ ව්‍යාපෘතියේ අරමුදල් යෙදවීමට අපොහොසත් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ලබා නොගත් ණය මුදල් මත රු. මිලියන 2.544ක බැඳීම් ගාස්තු ණය නියෝජිතායතනයට ගෙවා ඇති අතර 2022 දෙසැම්බර් 31 දිනට සමුච්චිත බැඳීම් ගාස්තු රු. මිලියන | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ මාර්ග සංවර්ධන අධිකාරිය යන ආයතන දෙකටම මෙම ණය පහසුකම ලබා දී ඇත. මාර්ග සංවර්ධන අධිකාරිය 2019 වර්ෂයේ දී ණය ලබාගැනීම ආරම්භ කර ඇති අතර එමගින් ණය මුදලෙහි ඉතිරි සම්පූර්ණ මුදල සඳහා බැඳීම් ගාස්තු සක්‍රීය කර ඇත. එබැවින්, 2022 වර්ෂයේ ශ්‍රී ලංකා | ව්‍යාපෘතියේ අනවශ්‍ය පිරිවැය අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 7.303 විය. | වරාය අධිකාරියේ කොටසට අදාළ දක්වා ඇති රු. මිලියන 2.544 ක බැදීම් ගාස්තුව නියම ගාස්තුවක් නොව, දැනටමත් ගණනය කර මුළු ණය මුදලට ඇතුළත් කර ඇති අනිවාර්ය ගාස්තුවකි. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා එක් එක් අයිතම සඳහා වගකීම් නියම කරමින් ක්‍රියාකාරකම්, ඉලක්කගත කාල සීමාව, භෞතික හා මූල්‍ය ඉලක්ක සඳහන් සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සකස් කර නොතිබුණි. | සියලුම ව්‍යාපෘති ඇතුළත් පොදු ක්‍රියාකාරී සැලැස්මක් අදාළ ව්‍යාපෘති අංශය විසින් සකස් කරනු ලැබේ. මීට අමතරව, මහා භාණ්ඩාගාරයේ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන ආකෘතිය මත පදනම්ව ව්‍යාපෘතියේ එක් එක් ප්‍රධාන අයිතම ඇතුළත් වෙනම මාසික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. | සමාලෝචිත වර්ෂය සඳහා ඉලක්ක සහ අත්කර ගැනීම් මැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති කාලය 2023 මාර්තු 31 දින අවසන් වුවද 3 වෙනි කාල දීර්ඝ කිරීම් සඳහා 2023 මැයි 31 වන විටත් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2023 ජනවාරි මාසයේදී සවිකිරීම්පොළ සඳහා වෙන් කර ඇති ස්ථානය වැඩපල කොන්ත්‍රාත්කරු වෙත පැවරීමට නියමිතයි. වැඩපල කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය 2023 මාර්තු අවසානය වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත. | තවදුරටත් ප්‍රමාද වීමකින් සහ අමතර පිරිවැයකින් තොරව ඉදිකිරීම් නිමකිරීමට අවශ්‍ය පියවර ගතයුතුය. |